


නිර්මාණ අඩවිය



## සංසාර චක්‍රය

නෙතු පුරා දිළි සෙනේ කඳුලකට කැටි කරන
වත පුරා සිනා කැන් සුසුමකට ලං කරන
හද පුරා ඔඩු දුවා දුකට පිහිටක් නොදෙන
සංසාර චක්‍රයද? මේ....

කාසියට පණ පොවන
ආශාව ලුහු බදින
පිවිතේ මිරිගුවද? මේ

**විනිතා තලේරත්න**



## කිරි සුවඳ සහ මව

**විද්‍යානි මනතුංග**

කිරි සුවඳට මුහුණ තියන් - හඳ
බලන්න ආස හේද
පුංචි දෝනි ගේ පිල වෙත මා
කැඳවනවා

පොඩි තරු කැට උඩු ගුවනට - මේ
තරමට ඇයි මොකටද
මටත් එකක් දෙකක් දෙන්න බැරිද අහනවා
දුර තරු කැට මට මොකටද - මෙ සඳ වත ගේ පිල මත
මා උකුලේ මා අසලම බලන් ඉන්නවා
රැය පුරාම මා හදවත එළිය කරනවා

ඇයි අමමේ මේ ලස්සන - දවල්ට නැත්තේ අපි ලඟ
හිරු ඇවිදින් මේ ලස්සන මුවහ කරනවා
මෙ සුදු වත රෑ නිදි කල - නැති ලස්සන ඇති කරන්න
හිරු කුමරුන් මේ ලෝකෙම එළිය කරනවා
ඒ හිරු තෙද බල අරගෙන - මේ දුව හෙට ලොකු වන කල
මගෙ ලෝකයෙ සඳ හිරු තරු එකට දිලෙනවා

මේ සඳ තරු ඒ තෙද හිරු - අල්ලා ගන්නා තරමට
මා පොඩි අත දිගු වන දින ලගද අහනවා
සඳු වැනි ගුණ හිරු වැනි තෙද - දුව ලද දින හෙට ලොව
තුල
මා නොදුටුව බොහො ලස්සන දුවට පෙනෙනවා
මා අසලින් දුව හිඳගෙන - ලෝකය ගැන නොදත් කතා
කියනා දින එනතුරු මන් බලන් ඉන්නවා



## සොයුරියනේ .. ..

පුච්චානම් බස් තෙපලන
රසමසවුළු තුටින් පුදන
රන් මසුරන් මග අතුරන
සලෙලුන් පිරි නුවර සරන
රුවින් උතුම් නැගනියනේ....

සුසිනිඳු සළු පොරවාගෙන
මග සරසන කොමල ගමන
පාද සලඹ නැතත් නුඹට
රඟන ලියක හැඩ ගෙනේ .. .

දුටුවන් නෙත් මන් මත්වන
උඹෙ වත දෙස ගිජුව බලන
පහස සොයන කාම නුවර
අසිරිය නැහැ මුවැත්තියේ....

හෙට එලිවන තුරු එපා ඉන්න
ගෙදර යන්න නැගනියනේ.....

**උදය ගෝවින්න**

## සතිපූජා



අඬන්නට ඇසේ කඳුළක් නෑ
හෙළන්නට හදේ සුසුමක් නෑ
පාළු දිවියට
තනි මකන්නට
ලොවේ කිසිවෙක් නෑ

සනාතන ලෝ දහම විලසේ
ගලා යයි දුක මෙලෝ තලයේ
කුණාටුව මැද
විලාපයෙ හඬ
දරා ගනු නොහේ හද පතුලේ

වසන්තය ගින්දරෙන් නැසුණා
දිගන්තය කළු දුමෙන් වැසුනා
බුරා ගෙන එන
මහා ගිනි ගොඩ
මැදින් මට සදා සුව පෙනුණා

**රසිකා පෙරේරා**
සිඩ්නි

## අහිමි වසන්තය

**ජීවිතය හුදෙකලා**
**ගීතයක් සේ දැනෙයි.........**
**සැනසුමක් නැති සිතට**
**වේදනාවන් මැවෙයි..........**
**වසන්තයේ මිහිර මතු**
**නොයෙන බව**
**මට සිතෙයි**
**ආදරේ වේදනාවෙන්**
**මගේ සිත හඬයි.........**

**ධම්මි විජේසිංහ**
**කැනඩාව**

## Blind Musician and Me

You move away without looking back
I stay here mute deaf and crack
You take away with you all joy I gain
What left for me is only sorrow and pain

I descend the street in frozen winter night
Heavy woollen coat is hanging on my back
A blind musician only soul seen at sight
Plays his guitar sitting on his sack

Oh that melody brings me a remedy
I stand still with closed eyes
The warmth of music relaxes my body
Letting all my sorrows be at a side

While rhythm of music drifts through the night
His sense roams querying is anyone around?
I put a coin and started to walk
A tiny smile acknowledge his sense

**Sriya Kumarasinghe**
New Zealand

## ගම් පියස

නිල්වලා නදී මව
පහස පතමින් ඇදෙන
කිරඹාර නදීතෙර
පාලුගඟ අභියසෙහි
ඉපිද ගම කෙලිදෙළින්
වැඩුන හැටි මතකයෙන්
මකාලිය හැකිද මට ..!

නුහුරු බසකින් දොඩන
ජනී ජන කැලත මැද
හඬනගා හිස් වදන්
දොඩන මුත් සිත්තොසින්..

ගම ඉපිද මෙහි පැමිණ
සිහල බස නුහුරු ලෙස
තතනමින් බස් දොඩන
මවා ගත් චරිත දැක
හඬ නගා කියමි මම..

පුහුදුන්වූ මිනිසුනේ...
මා උපන් ගම්තොටෙහි
සුවඳ මා ලඟ තිබේ..
මගේ රට සිරිලකයි..
මගේ බස හෙලබසයි..
මා දෙඇස වැසෙන තුරු
මා හදින් සිහල වෙම්..

**විජයසිරි තිලකුමාර**

පහන් වැට ට ලියන්න. සන්නස පහන් වැට කාව්‍ය නිර්මාණ විශේෂාංගයට ලැබෙන කවි අතරින් එක් කවියකට වටිනා ඩීවීඩී තැටියක් පිරිනැමීමට ඔස්ට්‍රේලියාව පුරා විජය ප්‍රොඩක්ට්ස් බෙදාහරින DBSJ එන්ටප්‍රයිස් සුදානම්

**DBSJ Enterprise Tel/Fax 03 8336 1113**

ජූලි මාසයේ පහන් තරුවට කවි ලියා මෙල්බන් හි DBSJ Enterprise වෙතින් DVD තැටි දෙකක් ලබන්නට වරම් ලද කිවිඳිය

**රසිකා පෙරේරා සිඩ්නි**

